ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

<u>පුවත්පත් නිවේදනය</u>

ශ්‍රී ලංකාවේ කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යතුමා සහ ඉන්දියානු මහ කොමසාරිස්තුමා එක්ව LANKAPAK 2019 ප්‍රදර්ශනය විවෘත කරයි

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා සහ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා විසින් LANKAPAK 2019 ප්‍රදර්ශනය කොළඹ, BMICH හිදී අද විවෘත කෙරිණ. කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය බුද්ධික පතිරණ මැතිතුමාද මෙම අවස්ථාවට සහභාගී විය.**

---

ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ සභාපති අනුරාධ ජයසිංහ මහතා, ආසියානු ඇසුරුම් සංසදයේ සභාපති රොහාන් වික්ටෝරියා මහතා, CDC Events (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂ ඉම්රාන් හසන් මහතා සහ ඉන්දියාවේ PHD Chamber of Commerce and Industry හි ලේකම් රාකේෂ් සාරංගී මහතා සහ තවත් අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී විය. PHD Chamber of Commerce and Industry හි සහයෝගය ඇතිව ඉන්දියානු සමාගම් 40 ක් පමණ මෙම ප්‍රදර්ශනයට සහභාගී වේ.

මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් ගරු රිෂාඩ් බදියුදීන් අමාත්‍යතුමා ජාත්‍යන්තර සන්නාමකරණයේදී මුද්‍රණ සහ ඇසුරුම් ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම පිළිබඳව සඳහන් කළේය. විශේෂයෙන්ම, ආහාර සහ පාන වර්ග

ඇසුරුම් කිරීම සඳහා නව්‍ය ක්‍රමවේද භාවිතා කරන ලෙස ඔහු කර්මාන්තකරුවන් දිරිමත් කළේය. එසේම ඇසුරුම් ක්ෂේත්‍රය තුළ පරිසර හිතකාමී තාක්ෂණය භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳවද එතුමා අදහස් දැක්වීය. අගය දාම ශක්තිමත් කිරීම සඳහා විවිධ රටවල කුඩා සහ මධ්‍ය පරිමාණ සමාගම් අතර සහයෝගීතාවය ඉහළ නැංවිය යුතු බවද අමාත්‍යතුමා අවධාරණය කළේය.

මෙම අවස්ථාවේදී මහ කොමසාරිස්තුමා මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ පැවති ප්‍රදර්ශන සඳහා ඉන්දියානු සමාගම් විශාල වශයෙන් සහභාගී වීම පිළිබඳව සිය සතුට පළ කළේය. ඒ තුළින් භූගෝලීය ආසන්නතාවය පමණක් නොව දෙරට අතර පවතින සමීප මිත්‍රත්වයද පිළිඹිබු වන බව එතුමා ප්‍රකාශ කළේය. ආරක්ෂාකාරී, සෞඛ්‍යසම්පන්න සහ ආකර්ෂණීය ඇසුරුම්කරණයේ වැදගත්කම පිළිබඳව අදහස් දැක්වූ එතුමා ඒ තුළින් අපගේ පාරිසරික තිරසාරභාවයට ඇතිවන බැලපෑම පිළිබඳව සැලකිලිමත් වීමේ අවශ්‍යතාවයද පෙන්වා දුන්නේය. ඉන්දීය අග්‍රමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා එක්වරක් පමණක් භාවිතා කරන ප්ලාස්ටික් භාවිතය ඉදිරි වසර වලදී තහනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳවද සඳහන් කළ මහ කොමසාරිස්තුමා ඇසුරුම්කරණය සඳහා කඩදාසි, රෙදි සහ වෙනත් විකල්ප ද්‍රව්‍ය භාවිතා කළ හැකි බවට යෝජනා කළේය.

මෙම ප්‍රදර්ශනය 2019 සැප්තැම්බර් 13 වන දිනෙන් අවසන් වේ.

***

කොළඹ

2019 සැප්තැම්බර් 11